දිනමිණ සිළුමිණ epaper

# ජාතික සමාජ සංවර්ධන ආයතනය
## (කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය)

# තනතුරු ඇබෑර්තු

1992 අංක 41 දරන ජාතික සමාජ සංවර්ධන ආයතන පනතේ විධිවිධාන යටතේ ක්‍රියාත්මක වන අතර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය අනුව 1978 අංක16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 A වගන්තිය යටතේ ජාතික සමාජ සංවර්ධන ආයතනය උපාධි පිරිනමනු ලබන ආයතනයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇත.

**01. තනතුර : ලේඛකාධිකාරී - තනතුරු 01 (MM 1-1)**

**02. රැකියා විස්තරය**

1. ජාතික සමාජ සංවර්ධන ආයතනය මගින් පවත්වනු ලබන සියලුම පාඨමාලා සඳහා සිසුන් බඳවාගැනීම, සිසුන්ගේ පෞද්ගලික ලිපි ගොනු පවත්වාගෙන යාම.
2. සෑම පාඨමාලාවක්ම හදාරන සිසුන්ගේ අධීක්ෂණ කටයුතු, විභාග සම්බන්ධ අධීක්ෂණ කටයුතු හා ආයතන විභාග මණ්ඩලවල ලේකම් වශයෙන් කටයුතු කිරීම.
3. පාඨමාලා හැදෑරූ සිසුන්ට සහතික පත්‍ර ලබාදීම.
4. උපාධි හා සහතික පත්‍ර ප්‍රධානෝත්සව සංවිධානය හා පවත්වාගෙන යාම.
5. ශිෂ්‍ය තොරතුරු කළමනාකරණ පද්ධතිය යාවත්කාලීන කිරීම හා පවත්වාගෙන යාම.
6. අධ්‍යක්ෂ ජනරාල් හා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන) විසින් පවරනු ලබන වෙනත් විශේෂිත කාර්යයන් ඉටුකිරීම.

**03. අධ්‍යාපන සුදුසුකම් :** බාහිර අයදුම්කරුවන්

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් මානව සම්පත් කළමනාකරණය / රාජ්‍ය පරිපාලන / රාජ්‍ය කළමනාකරණය / කළමනාකරණය උපාධියක් ලබා තිබීම සහ උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

අභ්‍යන්තර අයදුම්කරුවන් ( පහත 1 හෝ 2)

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කනිෂ්ඨ කළමනාකාර" JM සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05)ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**04. වැටුප් පරිමාණය :** MM 1-1 රු. ( 53,175 - 10 X 1,375 - 15 X 1,910 - 95,575)

**05. පොදු කොන්දේසි :**

- ❖ සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
- ❖ මෙය ආයතනයේ ස්ථිර තනතුරකි.
- ❖ තනතුරට තෝරාගනු ලබන අයදුම්කරු, සේවකයා විසින් 8% හා ආයතනය විසින් 12% ක් ගෙවන සේවක අර්ථ සාධක අරමුදලට (EPF) හිමිකම් ලබයි. මීට අමතරව සේවක භාරකාර අරමුදලට (ETF) ආයතනය 3% ක දායකත්වයක් ලබාදේ.
- ❖ අයදුම්පත සමග උප්පැන්න, අධ්‍යාපන, වෘත්තීය පළපුරුද්ද හා වෙනත් අදාළ සහතිකවල පිටපත් ඉදිරිපත් කළ යුතුය. ඔබ විසින් සාදගන්නා අයදුම්පත් 2024/01/19 දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලියාපදිංචි තැපෑලෙන්" පහත සඳහන් ලිපිනයට එවිය යුතු අතර, අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.
- ❖ වයස් සීමාව - අයදුම්පත් භාරන්නා අවසාන දිනට වයස අවු. 22 ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. (අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික සමාජ සංවර්ධන ආයතනය,**
**ලියනගේමුල්ල ,**
**සීදූව.**